# පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය මගින් සාමාජික සාමාජිකාවන් සඳහා ලබාදෙන ප්‍රතිලාභ

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

# පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය මගින් සාමාජික සාමාජිකාවන් සඳහා ලබාදෙන ප්‍රතිලාභ


**පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය**

අංක 53 ඒ. ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05.

දු. ක. අංක - 011-2556629

විද්‍යුත් තැපැල - **slpia@sltnet.lk - slpiaexco@gmail.com**


1-CM 25515

# සභාපතිතුමාගේ පණිවුඩය.

2017-05-20 වන දින පවත්වන ලද පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ 66 වැනි වාර්ෂික මහ සභා රැස්වීමේදී සාමාජික සාමාජිකාවන්ගේ ඡන්දයෙන් 2016/2017 වර්ෂවල සභාපති වශයෙන් මා කෙරෙහි විශ්වාසය තබා තෝරා පත්කර ගැනීම පිලිබඳව මාගේ අවංක හදපිරි කෘතඥතාවය ප්‍රකාශ කර සිටින්නෙමි.

හුදෙක්ම සියළු සාමාජික සාමාජිකාවන්ගේ සුභ සාධනය හා නීත්‍යානුකුල අපේක්ෂාවන් ඉෂ්ඨ කිරීම පිළිබඳව අවශ්‍ය නීත්‍යානුකුල කටයුතු කැපවීමෙන් හා කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම මාගේ වගකීම බව මා දනිමි.

ඒ වෙනුවෙන් පරීක්ෂක සංගමය වෙත සාමාජික මහත්ම මහත්මීන්ගේ දායකවීමෙන් සංගමය පවත්වාගෙන යන අතර, බහුතරයක් සාමාජිකයන් විසින් සංගමය මගින් ලබා දෙනු ලබන සුභ සාධනයන් පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම නිසා ලබා ගත හැකි ප්‍රතිලාභ ලබා ගැනීම මගහැරී යන බැවින්, සියළු සාමාජික මහත්ම මහත්මීන්ට මේ වන විට පරීක්ෂක සංගමය විසින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ පිළිබඳව මෙම පොත මගින් දැනුවත් කිරීමට අදහස් කලෙමි.

වයි. ද. එස්. පින්නදූවගේ,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
සභාපති
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

2-CM 25515

# පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ පරමාර්ථය.

සංගමයක් වශයෙන් එහි සාමාජික සාමාජිකාවන්ගේ අයිතීන් හා සුභසාධන කටයුතු තහවුරු කිරීම, වර්ධනය කිරීම, ආරක්ෂා කිරීම.

පොලිස් සේවය මහජන සේවයක් වශයෙන් සලකා එහි සාමාජික සාමාජිකාවන් අතර ආත්මගරුත්වය හා අන්නෝන්‍ය සුහදත්වය පැතිරීම, සේවය සඳහා වූ කැපවීම සහ එකමුතුකම වර්ධනය කර ගැනීම හා ඉහත දක්වන ලද කාර්යයන් සාර්ථක කර ගැනීම

# සාමාජිකත්වය හා සාමාජික මුදල්

නිත්‍ය පොලිස් බලකායේ පරීක්ෂක ශ්‍රේණියට අයත් උප පොලිස් පරීක්ෂක, පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරී / නිලධාරිණියන් 9500 ට පමණ ආසන්න සාමාජික සාමාජිකාවන් පිරිසක් මෙහි සාමාජිකත්වය ලබා ඇති අතර, සංගමයේ මාසික සාමාජික මුදල රු. 400.00 ක් වේ. මෙම මුදල වාර්ෂික මහා සභා රැස්වීමේදී නිලධාරීන්/ නිලධාරිණියන්ගේ කැමැත්ත මත සංශෝධනයන්ට බඳුන් විය හැක.

## නිලධාරි/නිලධාරිණියන් විශ්‍රාමයාමේදී / මියයාමේදී හෝ සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීමේදී.

(2017-05-20 වන දින පැවති 66 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවක් මත රු.200,000/ ක උපරිම සීමාව ඉවත් කර, එම තනතුරේ රාජකාරී කරන පූර්ණ කාලසීමාව දක්වා සෑම වර්ෂයක් සඳහා රු. 7,500/- බැගින් 2017 මැයි මාසයේ සිට ගෙවනු ලැබේ.)

1. **පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය මගින් සාමාජික /සාමාජිකාවන් වෙත ලබා දෙන පාරිතෝෂික දීමනාවः (Gratuity Payment) වැඩිකිරීම.**

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ 2016/2017 වර්ෂයන් සඳහා පත්වන ලද විධායක කමිටුව විසින් සාමාජික / සාමාජිකාවන් වෙත ලබා දෙන පාරිතෝෂික දීමනාව**(Gratuity Payment)** 151 වැනි පොලිස් දින සැමරුමට සමගාමීව 2017-09-01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් වගුවෙහි දැක්වෙන ආකාරයට ගෙවීම් වැඩි කිරීමට තීරණය කර ඇත.

| සංගමයේ සාමාජිකත්ව කාලසීමාව | වර්තමාන දීමනාව ( රුපියල් ) | නව දීමනාව (රුපියල්) 2017.09.01 දින සිට |
|---|---|---|
| වසරකට අඩු | අයකර ගත් සාමාජික මුදල මෙන් දෙගුණයක් | අයකර ගත් සාමාජික මුදල මෙන් දෙගුණයක් |
| 01 ට වැඩි - 02 දක්වා | රු. 10,000/- | රු. 11,000/- |
| 02 ට වැඩි - 03 දක්වා | රු. 17,500/- | රු. 20,000/- |
| 03 ට වැඩි - 04 දක්වා | රු. 25,000/- | රු. 29,000/- |
| 04 ට වැඩි - 05 දක්වා | රු. 32,500/- | රු. 38,000/- |
| | | |
| 05 ට වැඩි - 06 දක්වා | රු. 40,000/- | රු. 48,500/- |
| 06 ට වැඩි - 07 දක්වා | රු. 47,500/- | රු. 59,000/- |
| 07 ට වැඩි - 08 දක්වා | රු. 55,000/- | රු. 69,500/- |
| 08 ට වැඩි - 09 දක්වා | රු. 62,500/- | රු. 80,000/- |
| 09 ට වැඩි - 10 දක්වා | රු. 70,000/- | රු. 90,500/- |
| | | |
| 10 ට වැඩි - 11 දක්වා | රු. 77,500/- | රු. 102,500/- |
| 11 ට වැඩි - 12 දක්වා | රු. 85,000/- | රු. 114,500/- |
| 12 ට වැඩි - 13 දක්වා | රු. 92,500/- | රු. 126,500/- |
| 13 ට වැඩි - 14 දක්වා | රු. 100,000/- | රු. 138,500/- |
| 14 ට වැඩි - 15 දක්වා | රු. 107,500/- | රු. 150,500/- |
| | | |
| 15 ට වැඩි - 16 දක්වා | රු. 115,000/- | රු. 164,000/- |
| 16 ට වැඩි - 17 දක්වා | රු. 122,500/- | රු. 177,500/- |
| 17 ට වැඩි - 18 දක්වා | රු. 130,000/- | රු. 191,000/- |
| 18 ට වැඩි - 19 දක්වා | රු. 137,500/- | රු. 204,500/- |
| 19 ට වැඩි - 20 දක්වා | රු. 145,000/- | රු. 218,000/- |

| සංගමයේ සාමාජිකත්ව කාලසීමාව | වර්තමාන දීමනාව ( රුපියල් ) | නව දීමනාව (රුපියල්) 2017.09.01 දින සිට |
|---|---|---|
| වසරකට අඩු | අයකර ගත් සාමාජික මුදල මෙන් දෙගුණයක් | අයකර ගත් සාමාජික මුදල මෙන් දෙගුණයක් |
| 20 ට වැඩි - 21 දක්වා | රු. 152,500/- | රු. 233,000/- |
| 21 ට වැඩි - 22 දක්වා | රු. 160,500/- | රු. 248,000/- |
| 22 ට වැඩි - 23 දක්වා | රු. 167,500/- | රු. 263,000/- |
| 23 ට වැඩි - 24 දක්වා | රු. 175,500/- | රු. 278,000/- |
| 24 ට වැඩි - 25 දක්වා | රු. 182,500/- | රු. 293,000/- |
| | | |
| 25 ට වැඩි - 26 දක්වා | රු. 190,000/- | රු. 309,500/- |
| 26 ට වැඩි - 27 දක්වා | රු. 197,500/- | රු. 326,000/- |
| 27 ට වැඩි - 28 දක්වා | රු. 205,000/- | රු. 342,500/- |
| 28 ට වැඩි - 29 දක්වා | රු. 212,500/- | රු. 359,000/- |
| 29 ට වැඩි - 30 දක්වා | රු.220,000/- | රු. 375 ,500/- |
| | | |
| 30 ට වැඩි - 31 දක්වා | රු. 227,500/- | රු. 393,500/- |
| 31 ට වැඩි - 32 දක්වා | රු. 235,000/- | රු. 411,500/- |
| 32 ට වැඩි - 33 දක්වා | රු. 242,500/- | රු. 429,500/- |
| 33 ට වැඩි - 34 දක්වා | රු. 250,000/- | රු. 447,500/- |
| 34 ට වැඩි - 35 දක්වා | රු. 257,500/- | රු. 465,500/- |
| | | |
| 35 ට වැඩි - 36 දක්වා | රු. 265,000/- | රු. 485,000/- |
| 36 ට වැඩි - 37 දක්වා | රු. 272,500/- | රු. 504,500/- |
| 37 ට වැඩි - 38 දක්වා | රු. 280,000/- | රු. 524,000/- |
| 38 ට වැඩි - 39 දක්වා | රු. 287,500/- | රු. 543,500/- |
| 39 ට වැඩි - 40 දක්වා | රු. 295,000/- | රු. 563,000/- |

- ඉහත නව දීමනාව නිර්ණය කිරීමේදී සාමාජිකත්වයේ ජ්‍යෙෂ්ඨතාවය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

## 2. මූල්‍යමය දීමනා හා සුභසාධන කටයුතු.

### රෝහල් ගතවූ අවස්ථාවන් හිදී

### i. සෞඛ්‍ය පෝෂණාධාර දීමනාව (Nourishment Allowance)

සාමාජිකයෙකු රෝහල් ගතවුවහොත් එක් වර්ෂයකදී දිනකට රු.250/- බැගින් දින 90 ක් සඳහා උපරිමය රු.22,500/- ක් දක්වා ගෙවීම් සිදුකරනු ලබයි. (2017-08-08 දිනැති ආර්. ටී. එම්. 260)

### ii. වෛද්‍යාධාර දීමනාව (Medical Grant)

හෘද සැත්කම් සඳහා ලංකාවේදී හෝ පිටරටකදී සිදු කරන වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් රු. 50,000/-ක් බැලූන් සැත්කම සඳහාද, රු. 75,000/- ක් විවෘත හදවත් සැත්කම් සඳහාද ගෙවීම් සිදු කරනු ලබයි. (මෙම ගෙවීම තම සේවා කාලය තුළදී එක්වරක් පමණක් සිදු කරනු ලබයි.)

පිටරටකදී සිදු කරනු ලබන ඕනෑම වෛද්‍ය පරීක්ෂණයක් සඳහා රු. 75,000/- ක මුදලක් ලබා දීම. (මෙම ගෙවීම තම සේවා කාලය තුළදී එක් වරක් පමණක් සිදු කරනු ලබයි.)

## 3. සාමාජික /සාමාජිකාවන්ගේ ළඟම ඥාතීන්මියයාමේදී.

i. සාමාජිකයාගේ හෝ සාමාජිකාවගේ බිරිඳ, ස්වාමිපුරුෂයා, මව, පියා අවිවාහක දරුවන් මිය ගිය අවස්ථාවකදී සාමාජිකයාට හෝ සාමාජිකාවට රු. 10,000/- ක මරණාධාර මුදලක් ගෙවනු ලැබේ.

## 4. සාමාජික සාමාජිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව හා දිරි දීමනා ලබා දීම. (Scholaship Grant)

### i. 5 වසර ශිෂ්‍යත්වය

සාමාජික සාමාජිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව හා දිරි දීමනා ලබා දීමේ වැඩපිළිවෙලක් 2016 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වේ. මේ සඳහා 05 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින සියළුම සාමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන් වෙනුවෙන් අවශ්‍ය පොත්පත් ලබා ගැනීම සඳහා රු.5000/- ක දීමනාවක් ගෙවනු ලැබේ. **(මෙම දීමනාව අදාල වර්ෂයේ ජනවාරි 01 දින සිට ශිෂ්‍යත්ව විභාගය පවත්වන දින දක්වා පමණක් ගෙවනු ලැබේ.)**

### ii. විශ්ව විද්‍යාල ප්‍රවේශය

2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශය ලබන සාමාජික සාමාජිකාවන්ගේ දූ දරුවන් වෙනුවෙන් රු. 10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

## වෙනත් සේවාවන්

- සක්‍රිය සේවයේයෙදී සිටියදී හදිසියේ මියයන නිලධාරීන් සහ නිලධාරිණියන්ගේ විශ්‍රාම ගොනු සකස් කර ගැනීමේදී ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කර ගෙන යාම සඳහා පරීක්ෂක සංගමයක් වශයෙන් ඊට සම්බන්ධවී කටයුතු කිරීම.

- සාමාජික සාමාජිකාවකගේ අවමංගල්‍යකදී පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සියළු සාමාජික සාමාජිකාවන්ගේ ශෝකය පල කරන බැනරයක් ද මල් වඩමක් ද ලබාදීම සිදු කරනු ලැබේ. මෙම බැනරය සියළුම කොට්ඨාශ වල මූලස්ථාන පොලිසිවලින් ලබා ගත හැකි අතර, රු. 1500/- කට උපරිමයකට යටත්ව මල් වඩමක් අදාල කොට්ඨාශයේ පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් විසින් තැම්පත් කිරීමෙන් අනතුරුව අදාල මුදල සංගමයේ ලබා ගත හැක.

ඉහත ගෙවීම් හා සුභ සාධක කටයුතු ඉල්ලුම් කිරීම සඳහා වූ අයදුම්පත්, ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන සහ බිල්පත් පිළිබඳව වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා අපගේ දුරකතන අංකය **011-2556629** ඇමතීමෙන් හෝ **www.slpia.lk,** වෙබ් අඩවිය භාවිතයෙන් දැන ගත හැකිය.

ඔබගේ අදහස් හා යෝජනා **slpiaexco@gmail.com** හෝ **slpia@sltnet.lk** දරන විද්‍යුත් ලිපිනයන් හරහා අපවෙත එවීමෙන් තව දුරටත් සංගමයේ කටයුතු ශක්තිමත් හා කාර්යක්ෂම කර ගෙන යාමට මහගු පිටුවහලක් වේ.

අංක 53 ඒ. ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05.
දු. ක. අංක - 011-2556629
විද්‍යුත් තැපැල - **slpia@sltnet.lk - slpiaexco@gmail.com**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව